www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුරෝ ආධාර පැකේජයෙන් කම්කරු පන්තියට එරෙහි ප්‍රහාරය ඇරඹෙයි

## Euro aid package inaugurates offensive against working class

2010 මැයි 13

යුරෝපා නායකයින් සහ මුදල් ඇමතිවරු පසුගිය සතියේ යුරෝව බේරා ගැනීමේ පැකේජයක් සම්මත කර ගත්හ. මෙම පැකේජයත් සමග දෙවන ලෝක යුද්ධයෙන් මෙපිට කාලය තුලදී කම්කරු පන්තියට එල්ල වන්නට යන වඩාත් පුලුල් ප්‍රහාරය ඇරඹෙන්නේය. යුරෝපා කම්කරු පන්තිය ඒකාබද්ධව එල්ල කරන්නාවූ ප්‍රතිරෝධයෙන් මෙම ප්‍රහාරය පරාජය කල යුතුය.

ග්‍රීසිය වෙනුවෙන් මෙම සතිය තුල සකසා පිලියෙල කරන ලද යුරෝ බිලියන 110ක පැකේජය නිල වසයෙන් අනුමත කරනු වස් යුරෝ කලාපීය රටවල නායකයින් සිකුරාදා සන්ධ්‍යා භාගයේ බ්‍රසල්ස්හි දී මුන ගැසුනහ. කෙසේවුවද දෙහෝරාවේ රාත්‍රී භෝජන සංග්‍රහය පසුව අර්බුදය පිලිබඳව සාකච්ඡා වුනු හෝරා හයක රැස්වීමක් බවට පත් විය.

දෙදිනකට කලින් ග්‍රීසියෙහි පැන නැගි මහා වැඩවර්ජනය ග්‍රීක ආන්ඩුව හඳුන්වා දෙමින් සිටින පටි තදකිරීමේ පිලිවෙත්වලට එරෙහිව මතුවන ප්‍රතිරෝධයේ පරිමානය පැහැදිලිව පෙන්නුම් කර තිබින. ග්‍රීක ආන්ඩුව කල නය ගෙවීම් පැහර හැරීමක් පදනම් කරගෙන කල සමපේක්ෂනය තුලින් දැවැන්ත ලාභ ගොඩ ගසා ගෙන සිටි මූල්‍ය වෙලඳපොලවල් එවිට සන්ත්‍රාසයෙන් ඇලලී ගියේය. බ්‍රහස්පතින්දා එක් නිමේෂයක, ඇමෙරිකාවේ ඩව් ජෝන්ස් කොටස් මිල දර්ශකය සියයකට 9ක් දක්වා ප්‍රමානයකින් පහල වැටුනේය.

ග්‍රීසියට පමනක් නොව අනෙකුත් යුරෝ කලාපීය රටවලට ද නය ඇපවීම් සැපයීම සඳහා යුරෝපා ආන්ඩුවලට එල්ලවන පීඩනය මෙයින් ඉහල නැංවින. විරෝධය පෑම අත්හැර දමන ලෙස ජර්මානු චාන්සලර් ඇන්ජෙලා මර්කල්ට ඒත්තු ගැන්වීමට ජනාධිපති ඔබාමා පෞද්ගලිකව ම ඇයට දුරකථන ඇමතුමක් ගත්තේය.

අනතුරුව රැයෙහි පැවැත්වුනු සැසියක දී රාජ්‍යයේ ප්‍රධානීන් සහ ආන්ඩුවේ නායකයින් එක්ව පුලුල් මූල්‍ය පැකේජයකට පදනම් ලූහ. පසුව ඉරිදාවේ පැවැත්වුනු තවත් සමුලු රැස්වීමකදී එකී පදනම් තව දුරටත් විස්තාරනය කෙරින. සඳුදාවේ ජපන් කොටස් වෙලඳපොලවල් විවෘත කොට යුරෝවට එරෙහි සමපේක්ෂන රල දහර යලි නැග එන්නට කලින් සඳුදා උදෑසන මුල් හෝරා කිහිපය තුලදී ඒ පිලිබඳ අවසන් නිගමනයකට එලඹෙන්නට නියමිතව තිබින.

යුරෝ කලාපයේ සාමාජිකයන් හෙවත් යුරෝපා සංගමය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එක්ව යුරෝ බිලියන 750ක අරමුලක් පිහිටුවූවේය. නය ගෙවීම් පිලිබඳ දුෂ්කරතාවන්ට මුහුන පා සිටින යුරෝ කලාපීය රටවලට නය ලබා දීම සඳහා යලි මුදල් සැපයීමට අවශ්‍ය වුවහොත් යොදාගනු පිනිසය එම අරමුදල ස්ථාපනය කෙරුනේ. එමෙන්ම, පොලී අනුපාත වේගයෙන් ඉහල යාම වැලක්වීම සඳහා යුරෝ මහබැංකුව (ඊසීබී ) වඩාත්ම නය ගැතිව සිටින රටවල ආන්ඩුවලින් බැඳුම්කර මිලට ගත්තේය.

නායකයින් සහ මූල්‍ය ඇමතිවරුන් එක්ව මෙම දැවැන්ත මූල්‍ය පැකේජය පිරිනැමුවේ එය ව්‍යවහාර මුදලේ එක්සත්කම බේරා ගැනීම සඳහා ගත යුතුව තිබුනු අත්‍යවශ්‍ය පියවරක් ලෙසද ඉහලින් ම නය ගැති යුරෝ කලාපීය රටවලට ලබා දෙන ආධාරයක් ලෙසද පෙන්නුම් කරමිනි. එහෙත් සැබවින්ම නම් එය වූ කලී ජාත්‍යන්තර බැංකුවල සහ ආයෝජන අරමුදල්වල රැකවරනය උදෙසා පිදුනු මූල්‍යමය ත්‍යාගයක් විය. නිල දේශපාලනයේ භාෂාවෙන් කියතොත් ඉන් අදහස් වූයේ "වෙලඳපොල සන්සුන් කිරීම" සහ ඒවායේ "විශ්වාසය" යලි දිනා ගැනීමයි. ග්‍රීක ආන්ඩුවේ නයට ද යුරෝවට ද එරෙහිව ඔට්ටු අල්ලමින් අතිමහත් ධනස්කන්ධයක් උපයා ගත් සමපේක්ෂකයෝ තමන් මුහුන පාන සියලු අවදානම් මහජනයාගේ වියදමින් දුරුකර ගැනීමට සූදානමින් සිටිති.

මේ නිසා සඳුදාවේ කොටස් වෙලඳපොලවල කොටස් මිල ගනන් අති මහත් ලෙස ඉහල නැගින.

බේරා ගැනීමේ නව අරමුදලට කොටස් වෙළඳපොලවල ප්‍රශංසාව පල වූයේ එලෙසය. පසුගිය බ්‍රහස්පතින්දා හටගත් සන්ත්‍රාසයෙන් පසුව යුරෝපා ආන්ඩු තමන්ගේ පැත්තේ සිටින බවට සහතික ලද වෙළඳපොලවල් කම්කරු පන්තියට එරෙහි යුද ප්‍රකාශ කලේය.

පසුගිය සතියේ බුන්ඩෙස්ටාගයේ (ජර්මන් පාර්ලිමේන්තුවේ) අයවැය කමිටුව හමුවේ කතා කල ජර්මානු මූල්‍ය අධීක්ෂන මන්ඩලය හෙවත් බෆින්හි ප්‍රධානියා වන ජෝකීන් සැනියෙන්, යුරෝවට එරෙහිව නැග එන බලගතු සමපේක්ෂන රලපහරේ තරම පැහැදිලි කලේය. "යුරෝ කලාපයට එරෙහිව" පැන නැගෙමින් පවතින, දසබිලියන සංඛ්‍යාතයක් බවට පත් වෙමින් තිබෙන "අස්ථාවර සල්ලි ගොඩවල්" ඇඳුනු "සමපේක්ෂනයන්ගේ ආක්‍රමනකාරී යුද්ධයක්" පිලිබඳව සැනියෙන් එහිදී කතා කලේය. ග්‍රීසියේදී, තැන්පතු රක්ෂන (සීඩීඑස්) ගසා කෑ සමපේක්ෂකයන් මාස තුන හතරකදී සියයට 500ක ලාභයක් ලැබීමට සමත් වූහ.

ප්‍රධාන ආයෝජන බැංකුවල ශේෂ පත්‍ර තුලින්ද මෙම වාර්තාගත ලාභ පිලිබිඹු වේ. 2010 වසරේ පලමු කාර්තුව තුලදී ඩොයිෂ් බැංකුව යුරෝ බිලියන 2.8ක බදුවලට පෙර ලාභයක් වාර්තා කලේය. එනම්, ආයෝජන පදනම් කරගෙන සියයට 30ක ලාභයක් ලැබීය. එම කාර්තුවේදී ම, ගෝල්ඩ්මන් සැක්ස් බැංකුව ඉතිහාසයේ ප්‍රථම වතාවට සෑම වෙළඳපොල දිනයේදී ම ලාභයක් වාර්තා කලේය. බොහෝ දිනවල එය ඩොලර් මිලියන 100ක් විය.

සුභසාධන කැපීමේ, වැටුප් කැපීමේ සහ විරැකියාවේ රූපාකාරයෙන් දැන් මෙම දැවැන්ත මුදල් කඳුවල ප්‍රතිවිපාක භුක්ති විඳීමට නියමිතව සිටින්නේ කම්කරු පන්තියයි. යුරෝව බේරා ගැනීමේ නව පැකේජයත් සමග යුරෝපා ආන්ඩු මුලුමනින්ම ජාත්‍යන්තර මූල්‍ය ප්‍රාග්ධනයේ ග්‍රහනයට පත්ව සිටී. ඒවා ප්‍රබල ලෙස සිය අයවැය හිඟයන් අඩු කර නොගත හොත් ඒ පසුපසින් ඊලඟ සමපේක්ෂන රලපෙල නොවැලක්විය හැකි ලෙස ම නැගී එනු ඇත. එවිට ඉන් ගැලවීමට මූල්‍යමය ඇපවීම් ඉල්ලා සිටිය හොත් රාජ්‍ය අයවැයවල පවතින හිදැස් තව දුරටත් වර්ධනය වනු ඇත. එලෙස වඩා දැවැන්ත වූ පටි තද කිරීමේ පිලිවෙත් අවශ්‍ය වනු ඇත.

එම නිසා, යුරෝව බේරා ගැනීමේ පැකේජය වනාහී යුරෝපා සුභසාධන රාජ්‍යය මුහුන දෙන්නට යන මහත් විනාශය අඟවන දැවැන්ත යුරෝපා-පරිමාන පටි තද කිරීමේ වැඩ පිලිවෙලක ආරම්භය පමනකි ය යන අදහසට විශේෂඥයෝ එකඟ වෙති. මින් පෙන්නුම් කෙරෙන්නේ යුරෝපා සංගමයේ සැබෑ ස්වාභාවය යි. එනම් එය බැංකුවල ද යුරෝපා ධනේශ්වරයේ වඩාත් ම බලගතු කොටස්වල ද මෙවලමක් බවයි.

පැකේජය පිලිබඳව අදහස් දක්වමින් ෆිනෑන්ෂල් ටයිම්ස් පුවත්පත මෙසේ කියා සිටියේය: "යුරෝපා සංගමයේ රටවලින් බොහොමයක් ජීවත් වන්නේ තමන් සතු වත්කම් ඉක්මවා යන අයුරිනි. . . . කල් තබා විශ්‍රාම ගැනීම, නිදහස් රාජ්‍ය සෞඛ්‍ය රැකවරනය සහ ත්‍යාගශීලී විරැකියා දීමනා තමන්ගේ මූලික අයිතීන් යැයි බොහෝ යුරෝපානුවෝ සලකා ගෙන සිටිති.... එහෙත් යුරෝපානුවන් දැන් පටි තද කිරීමේ පිලිවෙත් පිලි නොගත හොත්, අන්තිමේදී ඔවුන් වඩා ඉහල මට්ටමක කම්පනයක් ඇති කරන යම් දෙයකට - එනම්, ආන්ඩුව නය ගෙවීම් පැහර හැරීමට සහ බැංකු බිඳ වැටීමට- මුහුන පානු ඇත.

ජර්මනියෙහිද බොහෝ අර්ථ ශාස්ත්‍රඥයෝ දැඩි පටි තද කිරීමේ පිලිවෙත් ඉල්ලා සිටිති. "ආර්ථික ප්‍රඥාවන්තයෝ" නමින් හඳුන්වා ගන්නා සංවිධානයේ නායක වුල්ෆ්ගැන්ග් ෆ්‍රාන්ස් කියා සිටියේ, බේරා ගැනීමේ පැකේජයෙන් සිදු වූයේ "යුරෝ නිවහන තුල හටගත් ගින්න නිවා දැමීම" පමනක් බවයි. දැන් නිවහන "පිරිසිදු කිරීම" සඳහා කාලය එලැඹ ඇති බවයි. ආර්ථික විශේෂඥ කායි කාර්ස්ටෙන්සන් පැවසුවේ යුරෝ රටවල් තුල රැඩිකල් පටි තද කිරීමේ සැලසුම් ක්‍රියාවට නැංවිය යුතු බවයි. "ඒ රටවල් හැම එකක්ම තමන්ගේ නය අඩු කර ගත්තේ නැත්නම් තව අවුරුදු තුනක් යන කොට ගැටලු මීට වඩා විශාල වෙන්න පවා ඉඩ තියෙනවා," ඔහු කීවේය.

ග්‍රීසියෙහි ඇරැඹුනු දෙය - එනම්, සියයට 30කින් වැටුප් පහත හෙලීම, විශ්‍රාම වැටුප් සහ දීමනා අඩු කිරීම, රාජ්‍ය අංශයේ මහා සේවක දොට්ට දැමීම් - දැන් මුලු මහත් යුරෝපය සඳහාම වූ ආදර්ශයක් බවට පත් ව ඇත. යුරෝපය පුරා මෙම පිලිවෙත්වලට එරෙහි විරෝධය පෑම් සංවිධානය කල යුතුය, ජාත්‍යන්තර කම්කරු පන්තිය සමග ඒකාබද්ධ විය යුතුය.

මේ සඳහා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂවලින් ද වෘත්තීය සමිතිවලින් ද මුලුමනින්ම බිඳී වෙන් වීමක් අවශ්‍යය. දිගට හරහට සිදුවන රාජ්‍ය අයවැය කප්පාදු ක්‍රියාත්මක කිරීමෙහි ලා විකල්පයක් නැතයි පවසන එම පක්ෂ සහ වෘත්තීය සමිති මෙම කප්පාදු ක්‍රියාත්මක කිරීමෙහි ලා මූල්‍ය ප්‍රාග්ධනයට සිය සේවය පුද කරයි. ග්‍රීසියෙහි සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පැසොක් (PASOK)

පක්ෂය උග්‍ර පටි තද කිරීමේ වැඩ පිලිවෙලක් බලාත්මක කිරීමේ කර්තව්‍ය භාරගෙන ඇත. ස්පාඤ්ඤ ආන්ඩුවේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී නායක සැපටෙරෝ, යුරෝව බේරා ගැනීමේ පැකේජය නිවේදනය කෙරුනු වහාම රාජ්‍ය සේවයේ වැටුප් කැපීම් ප්‍රකාශයට පත් කලේය. පෘතුගාලය තුල සිටින සැපටෙරෝගේ සමාජවාදී සගයා වන සොක්‍රටීස් ද ඒ හා සමාන ම පිලිවෙතක් අනුගමනය කරයි.

බ්‍රිතාන්‍යයෙහි ටෝරීන් සහ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදීහු ලේබර් පක්ෂයේ ද සහාය ඇතිව උග්‍ර පටි තද කිරීමේ වැඩ පිලිවෙලක් ක්‍රියාත්මක කරනු පිනිස ආන්ඩුව භාර ගත්තා පමනකි. උතුරු රයින් වෙස්ට්ෆාලියාහි පැවත්වුනු ප්‍රාන්ත මැතිවරනයෙන් පසුව පටිතද කිරීමේ වැඩපිලිවෙල නව වටයක් පටවනු පිනිස සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය (එස්පීඩී) ආන්ඩුවට සහභාගී කරවා ගැනීම කෙරෙහි යලි වතාවක් අවධානය යොමු වෙමින් පවතී. හරිතයන් ද බැංකු බේරා ගැනීමේ පැකේජවලටත් ඒ හා බැඳීගත් පටිතද කිරීමේ පිලිවෙත්වලටත් සහය දී ඇත. ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදී සංගමයේ දක්ෂිනාංශිකයෙකු වන රෝලන්ඩ් කොක් - අනාගත මුදල් ඇමතිවරයා ලෙස පත් කල යුතු යැයි සාකච්ඡාවට පාත්‍රවෙමින් සිටින්නේ මොහුය - දැඩි පටි තද කිරීමේ පිලිවෙත්වල ද මෑත වසරවලදී සම්මත කර ගැනුනු අධ්‍යාපනයට අදාල සියලු ප්‍රතිසංස්කරන අත්හැර දැමීමේ ද අවශ්‍යතාව දැනටමත් මතු කරමින් සිටී.

මෙම කප්පාදුවලට එරෙහිව නැගෙන ප්‍රතිවිරෝධය මර්දනය කිරීමේදීත් කම්කරුවන් බෙදා වෙන් කිරීමේදීත් විරෝධයපෑම් විසුරුවා හැරීමේදීත් මෙම සෑම රටකම වෘත්තීය සමිති ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි. කලින් තමන් "වම්මුන්" යැයි හඳුන්වා ගත්, එහෙත් අද දින විප්ලවවාදී ඉදිරි දර්ශනයක් මත සටන් වැදීම තදින්ම ප්‍රතික්ෂේප කරන සුලු ධනේශ්වර සංවිධාන රොත්තකින් ලැබෙන සහාය ද ඒවා භුක්ති විඳී.

සති අන්තයෙහි සම්මත කර ගැනුනු ආධාර පැකේජයත් සමග කම්කරු පන්තියට එරෙහි ප්‍රහාර සාර්ව යුරෝපා රූපාකාරයක් අත් කර ගන්නේය. අන්‍යෝන්‍ය මූල්‍ය සහාය තහනම් කිරීම සහ යුරෝපා මහ බැංකුවේ ස්වාධීනත්වය වැනි මූල්‍යමය එක්සත්කම හසුරුවන නීති කිහිපයක් අත්හැර දමා ඇත. කිසියම් ආන්ඩුවක් සිය ඉතිරි කිරීම් ඉලක්ක නො සපුරන්නේ නම් එය අන් සියලු දෙනා කෙරෙහිම සෘජුව බලපායි. මෙය යුරෝපා සංගමය තුල ආතතීන් සැලකිය යුතු මට්ටමකට අවුලුවනු ඇත.

එලැඹෙමින් පවතින පන්ති අරගල සඳහා කම්කරු පන්තිය දේශපාලනිකව සූදානම් විය යුතුය. බැංකු උදෙසා පිරිනැමෙන බේරාගැනීමේ පැකේජවලට සහ ඒ හා බැඳුනු පටි තද කිරීමේ පිලිවෙත්වලට සහාය දෙන දේශපාලන පක්ෂවලින් හා සංවිධානවලින් ද පන්තිමය ගැටලුවලින් අවධානය වෙනතකට යොමු කිරීම සඳහා ජාතිකවාදය අවුලුවන වෘත්තීය සමිති සහ සුලු ධනේෂ්වර සංවිධානවලින් ද එය බිඳී ගත යුතුය.

ගැටුම පවතින්නේ ජර්මානුවන් අතර සහ ග්‍රීකයන් අතර හෝ යුරෝපානුවන් සහ ඇමරිකානුවන් අතර නො ව ජාත්‍යන්තර කම්කරු පන්තියත් ප්‍රාග්ධනය සහ එහි දේශපාලන දාසයනුත් අතරය.

ප්‍රහාරවලට එරෙහිව සියලු මට්ටම්වලදී විරෝධය පෑම් සංවිධානය කල යුතුය. දරිද්‍රතාවෙන් ද මර්දනයෙන් ද විරැකියාවෙන් ද වැඩෙන ජාතික ආතතීන්ගෙන් ද සමන්විත අනාගතයකට එරෙහිව පවතින එකම විකල්පය වන්නේ විප්ලවවාදී ක්‍රියාමාර්ගයක පදනම මත යුරෝපා කම්කරු පන්තිය එකමුතු කිරීමයි. එනම්, සියලු නය අවලංගු කිරීමේ, කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යටතේ බැංකු සහ ප්‍රධාන සමාගම් සමාජ සන්තක කිරීමේ, සමපේක්ෂනවලින් ලද ලාභ රාජ්‍ය සතු කිරීමේ සහ විශාල ආදායම් හා වත්කම් සඳහා ඉහල මට්ටමේ අය බදු පැනවීමේ වැඩ පිලිවෙලක් මත සමස්ත යුරෝපයේම කම්කරු පන්තිය එක්සත් කිරීමයි.

යුරෝපය ප්‍රගතිශීලී අයුරින් එක්සත් කල හැකි වන්නේ යුරෝපා එක්සත් සමාජවාදී ජනපදයක රූපාකාරයෙන් එනම් විප්ලවවාදී සමාජවාදී ක්‍රියාමාර්ගයක් ක්‍රියාවට නැංවීමේ පදනම මත පමනකි. එවැනි ඉදිරි දර්ශනයක් ඉදිරිපත් කරන එක ම ලෝක පරිමාන දේශපාලනික ප්‍රවනතාව වන්නේ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව යි. අපගේ ක්‍රියාමාර්ගය හදාරන ලෙස ද ලෝක සමාජවාදී වෙබ් අඩවිය කියවන ලෙස ද ජාත්‍යන්තර කමිටුවේ සටන්කරුවන් සමග එක්වන ලෙස ද අපි, කම්කරුවන්ගෙන්, ශිෂ්‍යයන්ගෙන් සහ සවිචාරාත්මක බුද්ධිමතුන්ගෙන් ඉල්ලා සිටිමු.

**පීටර් ෂ්වාර්ස්**

© www.wsws.org